# ශ්‍රී ලංකා ආර්ථික වර්ධන වේගය

# 2019දී 04%කින් ඉහළට - ලෝක බැංකුව

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 04%ක් දක්වා 2019 වසරේදී වර්ධනය වනු ඇති බව ලෝක බැංකුව සඳහන් කරයි. 2019 වසරේදී ලෝකයේ ආර්ථික තත්ත්වය පිළිබඳ ලෝක බැංකුව නිකුත් කළ වාර්තාවක මේ බව දැක්වෙයි.

ශ්‍රී ලංකාවේ ශක්තිමත් දේශීය ඉල්ලුම, යටිතල පහසුකම් සංවර්ධනය වීම හරහා සිදුවන ආයෝජන වර්ධනය හේතුවෙන් මෙසේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය ඉහළ යනු ඇතැයි ලෝක බැංකුව නිකුත් කළ වාර්තාවේ දැක්වෙයි.

කෙසේ වෙතත් සමස්තයක් ලෙස ලෝක ආර්ථිකය 2019 වසරේදීත් පහළ යනු ඇතැයි ලෝක බැංකුව පුරෝකථනය කරයි. 2018 වසරේදී 3%ක් වූ අර්ථික වර්ධනය 2019 වසරේදී 2.9%ක් දක්වා පහළ යනු ඇතැයි ඔවුහු පෙන්වා දෙති.

2019 වසරේදී දකුණු ආසියානු ආර්ථික වර්ධන වේගය 7.1%ක් දක්වා වර්ධනය වනු ඇති බවත්, දකුණු අසියාවේ ඉහළම ආර්ථික වර්ධන වේගය 7.3%ක් ලෙස ඉන්දියාව පෙන්වනු ඇති බවත් එම වාර්තාවේ දැක්වෙයි.

එසේම බංග්ලාදේශ ආර්ථික වර්ධන වේගය 7%ක මට්ටමක පවතිනු ඇති බවද ඔවුහු සඳහන් කරති.